# දැන් අපිත් දන්නවා

කතා පිටපත
ශ්‍රී දර්ශන නාරන්පනාව

චිත්‍ර
අනුර ශ්‍රීනාත්

ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රකාශකගේ පූර්ව අවසරයක් නොමැති ව මෙම ග්‍රන්ථය
සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් හෝ
කිසි ම මාධ්‍යයක් භාවිතයෙන් පිටපත් කිරීම, පළ කිරීම හෝ අලෙවි
කිරීම සපුරා තහනම් ය.

**දූන් අපිත් දන්නවා**

---

**ප්‍රථම මුද්‍රණය : 2025**

---

**ISBN 978-624-5917-84-6**

---

**නිර්මාණ සංකල්පය සහ පිටපත:**
ශ්‍රී දර්ශන නාරන්පනාව

---

**කවරය නිර්මාණය සහ ඇතුළත චිත්‍ර:**
අනුර ශ්‍රීනාත්

---

**ප්‍රකාශනය:**
ශ්‍රී ලංකා මහ බැංකුව

---

**මුද්‍රණය:**


තාත්තේ.....
අද බැංකුව පැත්තෙ යනවදෝ.?
මට බැංකුව පැත්තෙ යන්න අද නම් උවමනාවක් නෑ. ඇයි දුවට මොකද්ද බැංකුවෙන් කර ගන්න තියෙන්නෙ?
මම එකතු කර ගත්ත කාසි ටිකක් තියෙනවා. අනේ තාත්තෙ මට ඒ ටික මාරු කරලා ගෙනත් දෙන්නකෝ!
අපෝ... ඒක මහ කරදරයක්. බරට බරේ මම ඕක උස්සගෙන යන්නත් එපායැ. ඒ කාසි ටික මට දෙන්න. මම ඔයාට ඒකට හරියන්න නෝට්ටු දෙන්නම්
එතකොට ඒ කාසි ටික ආයෙත් අපේ ගෙදරමනෙ. මට ඕන ඒ කාසි ටික ගෙදරින් අයින් කරලා ඒ වෙනුවට නෝට්ටු ගන්න. ආයෙත් කාසි එකතුවෙයි නේ.
හරි හරි... මම ඔය කාසි ටික ගන්නෙ ගෙදර තියාගෙන ඉන්න නෙවෙයි. වියදම් කරන්න. ඔය කාසි ටික හරියට ගණන් කරලා තියන්න. මම හවසට මාරු කරලා දෙන්නම්.මට පරක්කු වෙනවා.
සිත්මී.... අන්න වෑන් එක ඇවිල්ලා හෝන් කරනවා.ඉක්මනට යන්න දුව.
හරී... මම යනවා.... තාත්තේ මගේ කාසි ටික....?
හරි හරි ඔයාට මම ඒ වැඩේ අද ම කරලා දෙන්නම්


කෙල්ල ළඟකදි ඉඳල හරි අරපිරිස්සමෙන් වැඩ කරන්නෙ. කන බොන දේවල් වුණත් නාස්ති නොකර ප්‍රයෝජනයට ගන්න කියලා මට නිතර ම කියනවා.
ඔය කාසි ටික වුණත් ලොකු උවමනාවකින් එකතු කළේ කාලයක ඉඳලා. ඇත්තට ම ඔයා දැන් ඔය කාසි ටිකට මොකද කරන්නේ.
ගෙදර එකතු වෙන මාරු කාසි වියදම් කරන්නෙ නැතුව අපි කරන්නෙ ලොකු වැරැද්දක්. බස් එකේදි අපේ ඉතුරු සල්ලි දෙන්න මාරු කාසි නෑ කියලා කොච්චර නම්.....
අපෙන් වැඩිපුර සල්ලි ගන්නවද? කඩේදි උනත් සමහර වෙලාවට ඉතුරු සල්ලි වෙනුවට දෙන්නෙ ටොෆියක්. ඒකෙන් වෙන්නෙ අපේ හිත් නරක් වෙන එක විතරයි.
ඉතින්.....?
ඉතින් ... ඉතුරු වෙන මාරු සල්ලි ටික ගනුදෙනු කරන්නෙ නැතුව ගෙදර තියාගෙන ඉතුරු දුන්නෙ නෑ කියලා අපි ම බනිනවා. කාගෙද වැරැද්ද?
මම මේ කාසි ටික තියාගෙන දරුවට නෝට්ටු ටිකක් දෙනවා.


අම්මා!!!
මං... ආවා !!!
සිත්මී.... ආව ගමන් කොහෙද ඔය දුවන්න හදන්නෙ?
අයියෝ අම්මා... අතන වංගුවේ කණුවෙ ලයිට් එක තවමත් පත්තු වෙනවා. ඊයෙ හවස දපු ගමන් වෙන්න ඇති.
ඇත්තට ම මේ පාරේ ගිය කාටවත් ඕක පෙනුනෙ නැද්ද? අඩු ම ගාණෙ අපේ තාත්තටවත් ?
තාත්තට අද උදේ එහා ගෙදර අංකල්ගෙන් ලිෆ්ට් එකක් හම්බ වුණා දුව. දෙන්නා කතා කර කර යනකොට ඒක දකින්න නැතුව ඇති.
ඇයි ඉතින් ඔයාට ඕක ගැන ඔච්චර කලබලයක්.?
කලබලයක්...? අම්මත් මගෙන් අහන ප්‍රශ්න. තාත්තමනෙ මට කියලා තියෙන්නේ නගර සභාව ඔය ලයිට්වලට එහෙම සල්ලි ගෙවන්නෙ අපෙන් "වරිපණම් බදු" කියලා අය කර ගන්න සල්ලිවලින් කියල.
!
එහෙනම් මේ නාස්ති වෙන්නෙ අපේ ම සල්ලි නෙවෙයිද?
හ්ම්......!!


තාත්තේ... මගේ කාසි ටික මාරු කළාද?
ඔව්... හැබැයි මං බැංකුවට නම් ගියේ නෑ. ඒ කාසි ටික මං තියා ගත්තා. මාරු කාසි ඕනෑ වෙනකොට ගනුදෙනු කරන්න.
මෙන්න ඒ ගණනට හරියන්න දුවට මම නෝට්ටු ගෙනාවා. ඇයි අම්මා කිව්වේ නැද්ද?
නෑ... අම්මාට අමතක වෙන්න ඇති.
ඒ කාසි ටික මම තියා ගත්තා. බස් එකටයි කඩේටයි ඕනෑ වෙනකොට දෙන්න.
අම්මේ, තාත්තා කියන කතාව ඇත්ත.
අම්මාත් හැම වෙලාවෙම කාසි ටිකක් පර්ස් එකේ තියා ගන්න. එතකොට ලේසියි. මාරු සල්ලි නෑ කියලා එක එක්කෙනාගෙන් කතා අහන්න ඕනැත් නෑ..


තාත්තේ..... ආයේ කවද්ද බැංකුව පැත්තෙ යන්නේ?
අෑ....? මේක හරි වැඩක්නෙ. මට බැංකු යනවා ඇරෙන්න වෙන වැඩක් නැතිවෙයි. දැන් ඊයෙත් ඇහුවා බැංකුවට යනවද කියලා.
?
හරි... හරී.... මගෙ හොඳ තාත්තනේ. කියන්නකෝ යනවද නැද්ද කියලා?
ඒකෙන් නම් මම බේරුණා. ඒ පාර මොකද්ද?
මට ඕනෑ මගේ අර සල්ලි ටික මගෙ බැංකු පොතට දා ගන්න.
ඇයි...? දැන් බැංකුවෙ මාමලා ඉස්කෝලෙට එන්නෙ නැද්ද?
හරී... කොහොම උනත් අපි ඉරිදා ටවුන් එකට යනවනේ. එතකොට සල්ලි ටික ඔයාගෙ ගිණුමට දමු.
අෑ... ඉරිදා?
ටික දවසකින් ආවෙ නම් නෑ. මට ඕනෑ මේ සල්ලි ටික ඉක්මනට පොතට දා ගන්න.
දැන් ඉරිදත් බැංකු ඇරලද තාත්තේ? ඉස්සර නම් එහෙම නෑ නේද?


නෑ... නෑ... බැංකු නම් වහලා තමයි. ඒත් දැන් අපට පුළුවන්නෙ මැෂින් එකෙන් සල්ලි තැන්පත් කරන්න.
තාත්තා ඔය කියන්නෙ අර ATM ගැන නේද? ඒවා තියෙන්නෙ සල්ලි ගන්න විතරක් නෙවෙයි ද තාත්තෙ?
අන්න හරි. ATM තමයි. කාලයක් යනකල් අපේ රටේ තිබුණෙ සල්ලි ආපසු ගන්න ATM විතරයි. ඒත් දැන් තියෙනවා සල්ලි තැන්පත් කරන්නත් පුළුවන් ATM. ඒවාට කියන්නෙ CDM කියලා. Cash Depsit Machine.
එතකොට CDM එකෙන් තමන්ගෙ ගිණුමට විතරද සල්ලි තැන්පත් කරන්න පුළුවන්?
නෑ.. නෑ.. ගිණුමක විස්තර දන්නනවා නම් ඕනෑම ගිණුමකට සල්ලි තැන්පත් කරන්න පුළුවන්. ඒ විතරක් නෙවෙයි. මගේ ගිණුමෙන් තව ගිණුමකට සල්ලි මාරු කරන්න, ගිණුම් ශේෂය දැන ගන්න වගේ සේවාවනුත් ඒකෙන් කර ගන්න පුළුවන්.
හා... නියමයිනෙ.
ඔව්... තාක්ෂණේ දැන් අපේ බැංකු ගනුදෙනු ගොඩාක් පහසු කරලා. අපේ ගනුදෙනු වැඩි හරියක් දැන් මැෂින් එකෙන් ම කර ගන්න පුළුවන්. බැංකුවට ගිහින් පෝලිම්වල හිටිය කාලෙ ඉවරයි.


හරි... හරි.... දැන් මට තාත්තට කිය කියා ඉන්න ඕනෑ නෑ. මම අම්මත් එක්ක ගිහිල්ලා මං එකතු කර ගත්ත සල්ලි ටික බැංකුවට දා ගන්නම්කෝ.
හා... හා.. බලමුකෝ.... මගේ දේණී... ඔයා හිතාගෙන ඉන්නේ ඔයා කැටේට එකතු කරන කාසි ටික CDM එකෙන් ගිණුමට දන්නද?
ඒවා හරියන්නේ නෑ. එකෙන් බාර ගන්නේ මුදල් නෝට්ටු විතරයි. එදාට ඔයාට ආයෙත් තාත්තා ඕනෑ වෙයි.
හා... හා... ඔච්චර ගණන් ගන්න එපා. ඔයා මගේ හොඳ තාත්තනේ......



අම්මේ... අපේ පන්තිවලින් ට්‍රිප් එකක් යනවා. ඊ ළඟ සිකුරාද, මමත් යන්නද?
කොහෙද යන්නෙ දුව ?
කොළඹ...
බලන්න යන තැන් ගැන කිව්වද?
ඔව්.... ජාතික කෞතුකාගාරයත්, කොළඹ වරාය නගරයත් බලනවා කිව්වා.... නව කිව්වා කෞතුකාගාරයක් ගැන ...
ම්.... ම්..... හරි මතක් වුණා. "ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාස කෞතුකාගාරය."
"ආර්ථික ඉතිහාස කෞතුකාගාරය" ....??
ඔව්... ඔව්... ආර්ථික ඉතිහාස කෞතුකාගාරය තමයි. මොකද්ද අම්මේ ඒ කෞතුකාගාරේ?
මම නම් ඒ ගැන දන්නෙ ම නෑ දුව. අපි තාත්තාගෙන් අහමු.


තාත්තේ .... අපි ලබන සතියෙ ට්‍රිප් එකක් යනවා කොළඹ. මටත් යන්න දෙනවා නේද?
යන්න... යන්න.... හැමදම ඉස්කෝලෙ වැඩවලට ම හිරවෙලා ඉන්න එකේ යාළුවෝ එක්ක පොඩ්ඩක් විනෝද වෙන්නත් එපායැ.
ඒක නෙවෙයි තාත්තෙ... අපි "ආර්ථීක ඉතිහාස කෞතුගාරය" කියල එකක් බලන්න යනවා කියලත් කිව්වා. ඒක ගැන විස්තර අම්මා දන්නෙත් නෑ.
"ශ්‍රී ලංකා ආර්ථීක ඉතිහාස කෞතුකාගාරය" කියන්නෙ ශ්‍රී ලංකා මහ බැංකුවට අයිති තැනක්. ඒක තියෙන්නෙ කොළඹ කොටුවෙ චැතැම් වීදියේ තියෙන අවුරුදු සිය ගණනක් පැරණි ගොඩනැගිල්ලක.
මොකද්ද තාත්තෙ ඒකෙ තියෙන වැදගත්කම. මොකද්ද "ආර්ථීක ඉතිහාසය" කියන්නෙ. "ඉතිහාසය" කියන එක නම් මට තේරෙනවා. ඒත් මේ "ආර්ථීකය" කියන්නෙ මොකද්ද?


"ආර්ථිකය" කියන වචනය ටිකක් තේරුම් ගන්න අපහසුයි වගේ පෙනුනට අපේ එදිනෙදා කටයුතුවලට ඒක ඉතා ම සමීපයි.
ඒ කියන්නෙ ?
හරි... දුව ම කියන්නකෝ අපට එදිනෙදා කටයුතු කරගෙන පහසුවෙන් ජීවත් වෙන්න මොනවද ඕනෑ කරන්නෙ?
මේ තියෙන හැම දෙයක් ම ඕනෑ වෙනව...
මං අහන්නෙ හැමදෙයක් ම කියන්නෙ මොනවද කියලා?
අන්න ඒක තමයි ... අපි එදිනෙදා ජීවිතේ පවත්වාගෙන යනකොට අපට අවශ්‍ය වෙන දේවල්වල සීමාවක් නෑ. ඒ දේවල්වලින් සමහර දේවල් අපට නැතුව ම බෑ. සමරහර දේවල් අත්‍යවශ්‍ය ම නැති නිසා ඒ පස්සෙ හරි ගන්න පුළුවන්.
බත්, මාළු, කිරි, එළවළු බිත්තර, බිස්කට්, සීනි, තේ කොළ, චොක්ලට්, රටකජු, ගවුම්, කමිස, කලිසම්, සාරි, සපත්තු, මේස්, බෙහෙත්, දොස්තරලා, බස්, පෙට්‍රල්, පොත්, පෑන්, පැන්සල්, මකන කෑලි, බෑග්, ඔර්ලෝසු, විදුලිය, වතුර, පත්තර, කඩවල්, සුපර්මාකට්, අයිස්ක්‍රීම්, සෙල්ලම් බඩු, මොබයිල් ෆෝන්, කම්පියුටර්, ඉස්කෝල, ඉස්පිරිතාල, පුස්තකාල, නගර සභාව....... **මී.... මෙහෙම කියන්න ගියොත් අපට ඕනෑ ජාතිවල ඉවරයක් නෑනෙ තාත්තෙ.**
ඒ වගේ ම ඔයා ඔය කියාගෙන ගිය ලැයිස්තුවේ තියෙන ඔක්කෝ ම දේවල් අපට ප්‍රධාන කොටස් දෙකකට වෙන් කරන්න පුළුවන්. එකක් "භාණ්ඩ". අනික"සේවා".


මට තේරෙන හැටියට නම් අපි කඩෙන් ගන්න දේවල් - ඒ කියන්නෙ කෑම බීම, ඇඳුම් පැළඳුම් "භාණ්ඩ".
මට පේන්නෙ දැන් ඔයාට "භාණ්ඩ" හා "සේවා" ගැන සරල අදහසක් තියෙනවා. ඉතින් දුව මේ භාණ්ඩ" හා "සේවා" අයිති වෙන මුළු පද්ධතිය තමයි "ආර්ථිකය" කියලා හඳුන්වන්නෙ.
ඉස්පිරිතාල, ඉස්කෝල, නගර සභාව වගේ දේවල් "සේවා". එහෙම කිව්වොත් හරිද තාත්තෙ?
දැනට ඔය විදියට දැනගත්තම ඇති. ට්‍රිප් එක ගිහිල්ල එන්නකෝ. ඊට පස්සෙ අපි තව දේවල් කතා කරමු.


භාණ්ඩ
Rice
Milk
Milk
CHOCOLATE
TEA
Full Cream MILK Powder
GAS
ICE CREAM


සේවා
FUELS
HOSPITAL
SUPER MARKET
School
FIRE
FIRE


ළමායි.... හැමෝම අහගන්න.....
හැම වෙලාවෙම තමන්ගේ කණ්ඩායමේ අය ළඟපාත ඉන්නවද කියල බලා ගන්න.
කෝ... කණ්ඩායම් නායකයෝ ඔක්කොම ඉන්නවද..... ?


අම්මෙට පෝර් හැලෙයි.... දෙයියෙට තව දුකයි
පොල්කද පොළෙන් ගෙනා ගොඩ කිරි අලුවා
නාම පටල ගත්ත ගීත ලොව ම කලඹ ගත්ත
බයිල ගමුද ඊ මික්ස් කරලා..
බයිල ගමුද ඊ මික්ස් කරලා .....
ආ.. ආ... ආ... ආ..... බයිල ගමුද
ඊ මික්ස් කරලා.. .....



මේ ..මේ... ළමයි මොනවද මේ කියන සිංදු. ඕව විතරද බයගොල්ලො දන්නෙ...... ?
කියනවකො ලස්සන සිංදුවක් !!
හා.. එහෙනම් නන්දන සර් ම කියන්නකො බලන්න හොඳ සින්දුවක්. අපටත් අහගන්න.


ඔන්න එහෙනම් අහගන්න අපි ඒ කාලෙ ට්‍රිප් යනකොට කියාපු සින්දු
ඉස්සන් මගුරන් ලොකු වැලි ගොව්වන් මේ දැන් අල්ලපු මාලු ලාබයි ගන්නකො යාලු...
සිලිං තුනයි වැල උඩහ ගෙදර මැගි නෝනට මේ දැන් වික්කේ සත දහයක් අඩු කරලා දෙන්නම් ගන්නවාද මැගි අක්කේ ......
හෙට්ටු කරළ මයි වලව්වෙ හාමුගෙ නෝනා නිතර ම ගන්නේ... තුට්ටුවෙ වාසිය වත් මට ලැබෙන්නෙ මහෙලා වගෙ අයගෙන් නේ ......
කමෝන් නන්දන සර්.....
කමෝන් අචලා මිස්.....


HOTEL
මොනවද සර් ඒ සිංදුවෙ කියන මාළු ගන්න දෙන සල්ලි. තුට්ටු, සිංලිං ..... අපි නං අහලවත් නෑ,
අනික සර් මාළු ගන්නකොට සත දහයක් අඩු කරලා වැඩක් තියෙනවද?
අහලවත් නෑ...? එහෙනම් ටිකක් ඉවසන්නකෝ. අපි ආර්ථික ඉතිහාස කෞතුකාගාරයෙදි ඒ ගැන හරියට ම දැනගනිමු.
අනික මුදලේ ඉතිහාසය ගැන බැලුවොත් ඒ කාලෙ සත දහයත් ලොකු මුදලක්.


ආයුබෝවන්.
දූලා පුතාලා මේ ඇවිල්ලා
ඉන්නේ ඉතා ම වැදගත්
තැනකට.
අපේ රටේ
ආර්ථිකයේ ඉතිහාසය
ගැන දැන ගන්න අවශ්‍ය
බොහෝ ම දේවල් මෙතන
තියෙනවා.


මෙතනින් පෙන්වන්නෙ අපි
මුලින් ම භාණ්ඩ හුවමාරුව
මගින් ගනුදෙනු කරපු විදිය.
ඒකට කියන්නෙ "බාටර්
ක්‍රමය"කියලා.
මේවා තමයි මුලින් ම අපේ
රටේ භාවිත වුනු කාසි.
"පුරාණ", "කහවනු",
"කහපන", "මස්ස" කියන
කාසි මෙතන තියෙනවා.


ඒ කාසි පාවිච්චි වුනේ මොන මොන දේවල් කරන්නද මාමේ? ඒ කාලේ අපි කවුරු එක්කද ගනුදෙනු කළේ?
ඒ කාලේ අපේ රටේ අය පිට රටින් ආ වෙළෙන්දෙන් එක්ක හරි හරියට ගනුදෙනු කරලා තියෙනවා. චීන, අරාබි, රෝම වෙළෙන්දේ, වෙළෙඳාම සඳහා අපේ රටට ඇවිත් තියෙනවා.


මේ කාසි අපි විදේශීය ජාතීන්ට - ඒ කියන්නෙ පෘතුගීසීන්ට, ලන්දේසීන්ට සහ ඉංග්‍රීසීන්ට යටත් වෙලා හිටිය කාල වකවානුවල පාවිච්චි කළ කාසි. තුට්டු, පනම්, සිලිං, පවුම් තමයි ඒ කාසිවල නම්.
එහෙනම් මේවා ගැන තමයි නන්දන සර් බස් එකේ එනකොට කිව්වෙ...
STUIVER 1783


මේ තියෙන්නෙ මුදල් නෝට්ටු ප්‍රදර්ශන අංශය. අතීතයේ ඉඳලා මේ දක්වා ම අපේ රටේ පාවිච්චි කළ මුදල් නෝට්ටු ඔක්කෝ ම මෙතන දී දැක ගන්න පුළුවන්.
ඒ කියන්නෙ මහ බැංකුව පටන් ගන්නත් කලින් අපේ රටේ මුදල් නෝට්ටු තිබුණද?
ඔව්.. ඔව්.. ලංකාවේ පළමු නෝට්ටු කාණ්ඩය 1875 මැයි 10 වැනිද, තමයි නිකුත් වෙලා තියෙන්නෙ.
ඒ නෝට්ටු කාණ්ඩය පතාග 50, 100, 500 සහ 1000 යන වටිනාකම්වලින් තමයි නිකුත් වෙලා තියෙන්නෙ. ඒ කාලයේ අපේ රට පාලනය වෙලා තියෙන්නේ ලන්දේසීන් විසින්.


මෙතන තියෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව පටන් ගත්තාට පස්සේ නිකුත් කෙරුණු මුදල් නෝට්ටු. මේ දක්වා මුදල් නෝට්ටු කාණ්ඩ 11ක් මහ බැංකුවෙන් නිකුත් වෙලා තියෙනවා.
1000
CENTRAL BANK OF CEYLON
SPECIMEN
දුල පුතාලගෙන් කවුද දන්නේ අපේ රටේ කාසි සහ මුදල් නෝට්ටු නිකුත් කරන එක ම බලය තිබෙන ආයතනය මොකද්ද කියලා? දන්නා අය අත උස්සන්න බලන්න.
මමත් දන්නවා....
මම දන්නවා....
මම දන්නවා....
කියන්න බලන්න උත්තරේ..
ශ්‍රී ලංකා මහ බැංකුව


හරියට හරි.. අපේ රටේ කාසි හා නෝට්ටු නිකුත් කිරීමේ එක ම බලධාරියා තමයි ශ්‍රී ලංකා මහ බැංකුව. මේ කෞතුකාගාරය පාලනය වෙන්නෙත් මහ බැංකුවෙන් ම තමයි.
එතකොට කොහේද මාමේ ඒ මහ බැංකුව තියෙන්නෙ?
මේ ළඟමයි. අර පාරෙන් එහා පැත්තේ පෙනෙන ලොකු ගොඩනැගිල්ල තමයි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලය.
අපට මහ බැංකුව බලන්නත් යන්න පුළුවන්ද මාමේ?


පුළුවන්. දූලා පුතාලා අ.පො.ස. උසස් පෙළට ආර්ථික විද්‍යාව හරි වාණිජ්‍යය හරි ව්‍යාපාර අධ්‍යයනය හරි තෝරා ගත්තොත් දවසක මහ බැංකු ප්‍රධාන කාර්යාලයට ඇවිල්ලා එතන වැඩ කෙරෙන විදිය අහගෙන යන්න පුළුවන්. ඒකට මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවට දන්වලා කලින් අවසරයක් ගන්න ඕනෑ.
ඒත් දූලා පුතාලා මේ ගැන ගොඩාක් උනන්දු නිසා මම මේ අපිත් එක්ක වැඩ කරන නැන්දා කෙනෙකුට කියන්නම් ඉතාම කෙටියෙන් මහ බැංකුව ගැන යමක් කියලා දෙන්න කියලා.


ආයුබෝවන්...! දැන් දුවලා පුතාලා ආර්ථික ඉතිහාස කෞතුකාගාරය බැලුවා නේද? දැන් මට කියන්න බලන්න ඔයගොල්ලෝ ශ්‍රී ලංකා මහ බැංකුව ගැන මොනවද දන්නේ කියලා.
මහ බැංකුවෙන් තමයි අපට සල්ලි ලැබෙන්නෙ.
සල්ලි අච්චු ගහන තැනනෙ....
සල්ලි අච්චු ගහලා මිනිස්සුන්ට බෙදන්නෙ මහ බැංකුවෙන්.....


හරි... ඔක්කෝම දන්නෙ මහ බැංකුව කියන්නෙ අපට ගනුදෙනුවලට අවශ්‍ය සල්ලි අච්චු ගහලා දෙන තැන හැටියට. ඒකේ වැරැද්දක් නෑ. මහජනතාව වෙත සල්ලි නිකුත් කරන්න සිටින එක ම බලධාරියා මහ බැංකුව තමයි. ඒත් ඒක මහ බැංකුව රටේ ආර්ථිකය හොඳින් පවත්වා ගැනීම වෙනුවෙන් ඉටු කරන එක වැඩක් විතරයි.
ඒ ඇරෙන්න රටකට මොකටද මහ බැංකුවක්?
ඔව්. ඒක හොඳ ප්‍රශ්නයක්. මුදල් නිකුත් කිරීමට අමතර ව රටේ ආර්ථිකය හොඳින් පවත්වාගෙන යන්නත් මහ බැංකුවෙන් ලොකු වැඩ කොටසක් කෙරෙනවා. වෙළෙඳපොළේ භාණ්ඩ මිල දිනෙන් දින දිගට ම ඉහළ යනවා නම් අපේ අතේ තියෙන මුදලට ගන්න පුළුවන් භාණ්ඩ ප්‍රමාණය අඩු වෙනවා. වෙනත් විදිහකින් කිව්වොත් මුදලේ අගය අඩු වෙනවා. අන්න එතකොට ඒකට කියනවා උද්ධමන තත්ත්වයක් කියලා. මෙන්න මේ උද්ධමනය දිගින් දිගට ම වැඩි වෙනවා නම් ඒක රටේ ආර්ථිකයට හොඳ නෑ.
මේ වැඩේ දිගින් දිගට ම වුණොත් ඒක එක පැත්තකින් පාරිභෝගිකයාට බලපාලා පරිභෝජනය අඩු වෙනවා විතරක් නොවෙයි, නිෂ්පාදකයාට බලපාලා නිෂ්පාදනයත් අඩු වෙනවා.. අපේ මුදල් ඉතිරි කිරීමුත් අඩු වෙනවා.


අපේ තාත්තාත් කියනවා දවසින් දවස කඩවල්වල බඩු ගණන් යනවා. ලැබෙන පඩියෙන් ජීවත් වෙන්නත් අමාරුයි කියලා.
ඒ කියන්නෙ අපට බඩු මිල වෙනස් නොවී තියා ගන්න පුළුවන්නම් ඒක හොඳයි නේද?
හරියට හරී... අපට භාණ්ඩ හා සේවාවල මිල නිතර නිතර වෙනස් නොවී - ඒ කියන්නෙ "ස්ථාවර ව " තියා ගන්න පුළුවන් නම් උද්ධමනය පාලනය කර ගන්න පුළුවන් වෙනවා.
කොහොමද ඉතින් ඒක කරන්නේ?
අන්න ඒක කරන්න තමයි රටකට මහ බැංකුවක් අවශ්‍ය වෙන්නේ. අපේ මහ බැංකුවේ ප්‍රධාන වගකීම තමයි දේශීය මිල ස්ථායිතාව ළඟා කර ගැනීම සහ පවත්වා ගෙන යෑම. ඒ කියන්නේ භාණ්ඩ මිල අඩු හා ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම.


ඉතින් ඒ වැඩේ කරන්න මහ බැංකුව විවිධ පියවර ගන්නවා. මෙහෙම හිතන්නකෝ .... අපේ අතේ මුදල් ටිකක් වැඩිපුර තිබුණොත් අපි මොකද කරන්නේ?
තව මොනවහරි බඩු ටිකක් වැඩියෙන් ගන්නවා.
අන්න හරි... අපේ අතේ මුදල් වැඩිපුර තිබුණොත් අපි වැඩියෙන් භාණ්ඩ හෝ සේවා මිලදී ගන්න පෙළඹෙනවා. එතකොට ඉල්ලුම වැඩි වීම නිසා බඩු හිඟයක් ඇති වෙලා මිල ඉහළ යනවා. එතකොට මහ බැංකුව කරන්නේ ආර්ථිකය ඇතුලේ ගනුදෙනු කරන්න පුළුවන් මුදල් ප්‍රමාණය අඩු කරලා ඉතිරි කිරීම් වැඩි කරන්න ජනතාව පොළඹවන එකයි. මහ බැංකුව ඒක කරන්නෙ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වැඩි කිරීමෙන්. මහ බැංකුව පොලිය වැඩි කළා ම, ඒක වාණිජ බැංකුවලට බලපානවා. එතකොට වාණිජ බැංකු ගනුදෙනුකරුවන්ගෙන් අය කරන පොලිය වැඩි කරනවා. එතකොට ණය සඳහා ගෙවන්න වෙන පොලිය වැඩි වෙනවා. ඒ නිසා මිනිස්සු ණය අරගෙන වියදම් කිරීම අඩු වෙනවා. මුදල් ඉතිරි කරන්න හිතෙනවා. ඇයි එතකොට අපේ තැන්පතුවලට වැඩි පොලියක් ලැබෙනවානෙ.
ඒ වගේ ම තමයි අවශ්‍ය වෙලාවට බැංකු පොලිය අඩු කරන එකත් මහ බැංකුව කරනවා. එතකොට අපි ඉතිරි කිරීම් අඩු කරලා මුදල් වියදම් කිරීමට පෙළඹෙනවා. මේවා කරන්නේ මහ බැංකුවේ ඉන්න ආර්ථික විශේෂඥයන්ගේ පර්යේෂණ තොරතුරු සහ මග පෙන්වීම් මත. මේ විදියට පොලී අනුපාතිකයටයි ආර්ථිකයේ පවතින මුදල් ප්‍රමාණයටයි බලපෑම් ඇති කරන්න මහ බැංකුව ගන්නා ක්‍රියාමාර්ගය **මුදල් ප්‍රතිපත්තිය** කියලා සරල ව හඳුන්වන්න පුළුවන්. මේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න 2023 අංක 16 දරන මහ බැංකු පනතෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට නීතිමය බලයක් ලැබී තිබෙනවා.


උද්ධමනය පාලනය කරලා ජනතාවට පහසුවෙන් ජීවත් වෙන්න ඕනෑ කරන ආර්ථික පරිසරය හදන්න මහ බැංකුව නිරන්තරයෙන් ගන්නා වෑයම තමයි මම පුළුවන් තරම් සරල ව දූල පුතාලට කියලා දුන්නේ. මේවා ගැන ඉහළ පන්තිවල දී තවත් විස්තර දැන ගන්න පුළුවන්.
එතකොට තව මොනවද මහ බැංකුවෙන් කෙරෙන්නෙ?
දුව ඇහුවෙ හොඳ ප්‍රශ්නයක්.
දුවල පුතාල දන්නවනේ රටේ ඕනෑම ආයතනයක් පවත්වාගෙන යන්නෙ කිසියම් නීති පද්ධතියකට යටත් ව කියලා. ඒ නීති ක්‍රියාත්මක වෙන්නෙ පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගන්නා පනතක් මගින්. ඉතින් 2023 සැප්තැම්බර් මාසය වන තුරු ශ්‍රී ලංකා මහ බැංකුව පාලනය වුනේ 1949 අංක 58 දරන මුදල් නීති පනත මගින්. නමුත් 2023 දී නව පනතක් සම්මත වුණා. ඒක තමයි මම අර කලින් විස්තර කළ "2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත". දැන් මහ බැංකුව පාලනය වෙන්නෙ ඒ නීතිය යටතේ. ඒ අනුව මහ බැංකුවේ ප්‍රධාන අරමුණ තමයි මම අර කලිනුත් කිව්ව "දේශීය මිල ස්ථායිතාව ළඟා කර ගැනීම සහ පවත්වාගෙන යෑම". මම මෙතෙක් වෙලා පැහැදිලි කරලා දුන්නෙ අන්න ඒ අරමුණ ඉෂ්ට කර ගන්න මහ බැංකුව ගන්නා උත්සාහය ගැන තමයි.


ඊට අමතර ව මහ බැංකුවට තවත් අරමුණකුත් තියෙනවා. ඒක හඳුන්වන්නෙ "මූල්‍ය පද්ධති ස්ථායිතාව සුරක්ෂිත කිරීම" නමින්. අන්න ඒ අරමුණ ඉටු කර ගන්න අපේ රටේ තියෙන බැංකු, වෙනත් මූල්‍ය සමාගම්, ඒ කියන්නෙ ෆිනෑන්ස් කොම්පැනි, ලීසිං කොම්පැනි ආදියට බලපත්‍ර දීලා ඒ ආයතනවල කටයුතු රටේ ආර්ථිකයට බාධාවක් නොවන ආකාරයෙන් හරියට කරගෙන යනවා ද කියන එක ගැනටත් මහ බැංකුව නිරන්තරයෙන් සෙවිල්ලෙන් ඉන්නෙ.
එතකොට නැන්දේ අර සල්ලි අච්චු ගහන එක?
මම හිතුවා... පුතා ඔය ප්‍රශ්නය මගෙන් අහයි කියලා. ඇත්තට ම රටේ ජනතාවට කරදරයක් නැතුව ජීවත් වෙන්න පුළුවන් වෙන විදියට ආර්ථික කටයුතු පවත්වාගෙන යන්න මහ බැංකුවෙන් තව වැඩකටයුතු මහ ගොඩක් කෙරෙනවා. ඒ ඔක්කොම මේ වෙලාවෙ විස්තර කරන්න අමාරුයි. අපි පාවිච්චි කරන කාසි, නෝට්ටු එහෙමත් නැත්නම් හරියට ම කිව්වොත් අපේ ව්‍යවහාර මුදල් නිකුත් කරන එකත් මහ බැංකුව කරන එක වැඩක්.


ඊට අමතර ව විනිමය අනුපාත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, සංඛ්‍යා ලේඛන රැස් කිරීම හා බෙදා හැරීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළු සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම, සේවක අර්ථසාධක අරමුදලේ ගිණුම් කළමනාකරණය, මිනිස්සු වැරදි විදිහට හම්බ කර ගත්ත සල්ලි සහ ත්‍රස්තවාදයට සල්ලි සැපයීම වගේ දේවල් ගැන බුද්ධි සේවා මගින් දැනගෙන නීතියට අනුව කටයුතු කිරීම ඒවා අතරින් කීපයක්.
බොහෝම ස්තුතියි නැන්දේ.
ඒ විස්තරය ළමයින්ට විතරක් නොවෙයි. අපටත් හරි ම ප්‍රයෝජනවත්.
ඇත්තමයි. අපි මෙච්චර කල් මහ බැංකුව ගැන මොනවද දැනගෙන හිටියෙ...?


කට්ටිය ආපහු යනකොට පහළ තට්ටුවේ තියෙන පොත් විකුණන තැනටත් යන්න. මහ බැංකුවෙන් නිකුත් කෙරෙන වාර්තා ඇතුළු ප්‍රකාශන ගොඩක් එතන තියෙනවා. අවශ්‍ය කෙනෙකුට ඒවා මිලට ගන්නත් පුළුවන්.


කොහොමද සිත්මි.. ට්‍රිප් එක හොඳද?
නියමයි තාත්තේ... අපි ගොඩාක් සතුටු වුණා. ඒ විතරක් නොවෙයි මේ ට්‍රිප් එකේදී අපේ දැනුමට ගොඩාක් දේවල් එකතු වුණා. විශේෂයෙන් ම මහ බැංකුව ගැන සෑහෙන්න තොරතුරු දැන ගත්තා.
ඒ කියන්නෙ...?
නෑ ඉතින් අපි මෙච්චර කල් මහ බැංකුව ගැන දැනගෙන හිටියෙ මුදල් නෝට්ටු අච්චු ගහලා අපට දෙන තැන කියන එක විතරනෙ. ඒ වුණාට අපේ කරදරයක් නැතුව අපට ජීවත් වෙන්න මහ බැංකුවට අපට කොච්චර උදවු කරනවද කියලා දැන ගත්තෙ ඊයෙ.


ඒක නෙවෙයි තාත්තෙ... අපි ඉරිද වෙනකල් ඉන්නෙ නැතුව අදම යමුද මගේ සල්ලි ටික බැංකුවට දන්න. සුනිල් මාමාගේ ත්‍රී වීල් එකේ ම යං. මම දැක්කා සුනිල් මාමා ගෙදර ඉන්නවා. අනේ තාත්තෙ...
හරි එහෙනම් ගිහිල්ල එමුකෝ... එතකොට ඒ වැඩෙත් ඉවරයිනේ...
STORES
ආ... සිත්මි දුව.... ඊයෙ එනකොට ගොඩක් රෑ වුණාද? කොහොමද ට්‍රිප් එක හොඳද?
හොඳයි සුනිල් මාමේ.....
ඉතින් සුනිල මල්ලී... කොහොමද ජීවිතේ ?
අමාරුවෙන් කොහොමහරි ජීවිතේ ඇදගෙන යනවා අයියේ. ගෙයි වැඩ ටික ඉවර කර ගන්න ණයක් ගන්න හැදුවා. ඒකත් එතනම ඉවරයි. ළඟදී ණය පොලිය වැඩි කරලා.


කවුද .... බැංකුවෙන්ද කිව්වේ?
ඔව්... මේ ළඟ දී මහ බැංකුවෙන් පොලිය වැඩි කළාලු. පහුගිය කාලේ නම් පොලිය ටිකක් අඩු වෙලා තිබුණා. මම ණයක් ගන්න හිතුවේ ඒ නිසයි. කෝ.. පොලිය ආයෙත් වැඩි කරලානේ. ඒ නිසා ඒ වැඩෙත් දැන් හරියන්නෙ නෑ. මහ බැංකුවටත් කිසිම ප්‍රතිපත්තියක් නෑ අයියේ.
එහෙම කියන්න එපා සුනිල් මාමේ... මහ බැංකුව පොලිය අඩු-වැඩි කරන්නේ ගොඩාක් දේවල් ගැන හොයා බලලා. අවශ්‍ය වෙලාවට බැංකු පොලිය අඩු කරන්නත් අවශ්‍ය වෙලාවට ඒක වැඩි කරන්නත් මහ බැංකුවට නීතියෙන් ම බලයක් ලැබිලා තියෙනවා. අපි එදිනෙදා මිලට ගන්න බඩුවලයි සේවාවලයි මිල ඉහළ යන එක පාලනය කරන්න තමයි ඒ විදියට පොලිය අඩු-වැඩි කරන්නේ. ඉතින් අවශ්‍ය වෙලාවට පොලී අඩු වැඩි කරන එක තමයි මහ බැංකුවේ ප්‍රතිපත්තිය. ඒකට කියන්නේ **මුදල් ප්‍රතිපත්තිය** කියලා.
ඇහුනද සුනිල් මල්ලී...?


ඇහුනා... ඇහුනා... ඈ....
මම බැලුවේ සිත්මි දුව කොහොමද
මෙච්චර දේවල් දන්නේ කියලා..?
අපි ඊයේ ට්‍රිප් එකේ දී මහ බැංකුවේ
කෞතුකාගාරය බලන්නත් ගියානෙ සුනිල්
මාමේ. එහේ දී අපි මහ බැංකුව ගැන
ගොඩාක් කරුණු දැන ගත්තා. ඇත්තට ම
හරියට කරුණු නොදැන තමයි ගොඩාක්
අය මහ බැංකුවට දෙස් කියන්නේ. රටේ
ආර්ථිකය එක එක විදිහේ ගැටලුවලට
මුහුණ දෙන කොට අපට අපහසුවක්
නොවෙන විදිහට ඒවා විසඳන්න මහ
බැංකුව මැදිහත් වෙන විදිය ගැන
දැන් අපිත් දන්නවා.
BANK
දැන් අපිත් දන්නවා.

# ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ තවත් විස්තර දැන ගැනීම සඳහා

වෙබ් අඩවිය : www.cbsl.gov.lk
විද්‍යුත් තැපැල : cbslgen@cbsl.lk
සමාජ මාධ්‍ය :

**අධ්‍යාපනික වැඩසටහන් සඳහා විමසීම්**

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 1

දූරකථනඃ 0112477421
0112477965
0112477361
0112477135
0112477418
විද්‍යුත් තැපැල : awareness@cbsl.lk

**මහ බැංකු ප්‍රකාශන මිලදී ගැනීම සහ**
**ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාස කෞතුකාගාරය නැරඹීම සඳහා වමසීම්**

සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල
චැතැම් වීදිය
කොළඹ 1

දූරකථනඃ ප්‍රකාශන මිලදී ගැනීම - 0112477921
0112444302
0112477198

කෞතුකාගාරය නැරඹීම - 0112444303